සමෘද්ධි සංවර්ධන
දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development

කම්කරු, වෘත්තිය සමිති සබඳතා සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
தொழில்,தொழிற் சங்க உறவுகள் மற்றும் சமூகவலுவூட்டல்அமைச்சு
MINISTRY OF LABOUR,TRADE UNION RELATIONS AND SOCIAL EMPOWERMENT


| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல DSD/HO/09/CBO/INFORMATION<br>My No | ඔබේ අංකය<br>உமது இல ……………………………………<br>Your No | දිනය 2019.01.09<br>திகதி ……………………………………<br>Date |

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් වෙත,

සමෘද්ධි චක්‍රලේඛ :- **2018/06/ප්‍රජාමූල/07/2018/02** එකතු කිරීම් **2019/01**

**<u>සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන වාර්ෂික මහ සභා රැස්වීම් පැවැත්වීම හා ලියාපදිංචිය අළුත් කිරීම - 2019</u>**

උක්ත කරුණ සම්බන්ධව ප්‍රජාමූල සංවිධාන අංශය මගින් නිකුත් කරන ලද චක්‍රලේඛ අංක ප්‍රජාමූල/02/2017/02/ සහ 2018/06/ප්‍රජාමූල/07/2018/02 යන චක්‍රලේඛ අනුකූල කර ගනිමින් මෙම ලිපියේ කරුණුද පදනම් කර ගනිමින් 2019 වර්ෂයට ප්‍රජාමූල සංවිධාන හා ප්‍රාදේශීය සංවිධානවල වාර්ෂික මහ සභා රැස්වීම් පැවැත්වීම සහ ලියාපදිංචිය අළුත් කිරීමට කටයුතු කල යුතුය.

02. 2013 අංක 1 දරණ සමෘද්ධි පනතේ 09 හා 15 වගන්තිවලට අනුකූලව පිහිටුවන ලද සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන 2019 වර්ෂය සඳහා වාර්ෂික මහ සභා රැස්වීම් පැවැත්වීම හා ලියාපදිංචිය අළුත් කිරීම පිළිබඳව උපදෙස් මෙමගින් ලබා දෙනු ඇත.

03. වාර්ෂික මහා සභා රැස්වීම් පැවැත්වීම 2017 මාර්තු 07 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ ඇතුලත් 4(1)(අ) සහ 4(1)(ආ) යන නියෝගයන්හි සඳහන් පරිදි හා සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා ප්‍රාදේශීය සංවිධාන ව්‍යවස්ථාව හා පරිපාලන ව්‍යුහයේ 11 වන ඡේදයට අනුවත් සෑම සමෘද්ධි ප්‍රජාමූල සංවිධානයක්ම සහ සමෘද්ධි ප්‍රාදේශීය සංවිධානයක්ම වාර්ෂික මහ සභා රැස්වීම් පළමු කාර්තුව තුළ පැවැත්වීම සිදුකල යුතුය.

04. වාර්ෂික මහසභා රැස්වීම් පැවැත්වීම සෑම වර්ෂයකම මාර්තු 31 දිනට ප්‍රථම සිදු කල යුතු වුවද එය ජනවාරි 31 දිනට ප්‍රථම සිදු කිරීම වඩාත් සුදුසු බව කාරුණිකව දැනුම් දෙමි. සියළුම සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන ලේකම්වරු විසින් වාර්ෂික මහ සභා රැස්වීම පවත්වා මාසයක් ඇතුළත පහත සඳහන් උපදෙස් අනුව ලියාපදිංචිය අළුත් කිරීමේ අයදුම්පත්‍රය පිටපත් දෙකකින් සම්පූර්ණ කර ප්‍රාදේශීය සමෘද්ධි කළමනාකරු වෙත භාර දීම කල යුතු වන අතර සියළුම සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන ලේකම්වරු විසින් වාර්ෂික මහ සභා රැස්වීම් පවත්වා මාසයක් ඇතුළත පහත සඳහන් උපදෙස් අනුව ලියාපදිංචිය අළුත් කිරීමේ අයදුම්පත්‍රය පිටපත් දෙකකින් සම්පූර්ණ කර සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රජාමූල සංවිධාන හා ක්‍රීඩා අධ්‍යක්ෂ වෙත භාර දීම සිදු කල යුතුය. (2019 ජනවාරි 31 දිනට


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල් | අධ්‍යක්ෂ (පාලන හා ආයතන) | ප්‍රධාන ගණකාධිකාරී | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) | කාර්යාලය |
|---|---|---|---|---|---|
| | பணிப்பாளர் தலைமையதிபதி | பணிப்பாளர் ( நிர்வாகம்/தாபனம்) | பிரதான கணக்காளர் | பணிப்பாளர் (குறு நிதி ) | அலுவலகம் |
| | Director General | Director (Admin & Establishment) | Chief Accountant | Director ( Micro Finance) | Office |
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |
| | | **Hot Line :0112-889007** | | | |

ප්‍රථම වාර්ෂික මහ සභා රැස්වීම සිදු කලේ නම් පෙබරවාරි මස 28 දිනට ප්‍රථමද , මාර්තු 31 දිනට ප්‍රථම සිදු කරන්නේ නම් 2019 අප්‍රේල් 30 දිනට ප්‍රථම ඉදිරිපත් කල යුතුය. පෙර වර්ෂයේ ඉදිරිපත් කරන ලද ලියාපදිංචි කිරීමේ අයදුම්පත්‍රය සහ අදාල ඇමුණුම් උපයෝගී කර ගැනීමට කටයුතු කල යුතුය.)

05. සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන වාර්ෂික ලියාපදිංචිය අළුත් කිරීම සඳහා පහත සඳහන් පරිදි ක්‍රියා කල යුතුය.

(I) වාර්ෂික මහ සභා රැස්වීම් පැවැත්වීමේදී සමෘද්ධි චක්‍රලේඛ 2018/06/ප්‍රජාමූල/07/2018/02 හි ඡේද අංක 2.4 හි සහ 2.5 හි සඳහන් කාර්යයන් ඉටු කල යුතුය.

(II) සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී සහතිකයක් ලබා ගෙන ඇති සියළුම සමෘද්ධි ප්‍රජාමූල සංවිධානවල ලේකම්වරුන් විසින් ලියාපදිංචිය අළුත් කිරීමේ අයදුම් පත්‍රය පිටපත් 2 කින් සම්පූර්ණ කර සමෘද්ධි චක්‍රලේඛ 2018/06/ප්‍රජාමූල/07/2018/02 හි 3.1 හි සඳහන් ලියවිලි සමග මාසයක් ඇතුලත ප්‍රාදේශීය සමෘද්ධි කළමනාකරු වෙත භාර දීම කල යුතුය

(III) සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී සහතිකයක් ලබා ගෙන ඇති සියළුම සමෘද්ධි ප්‍රාදේශීය සංවිධානවල ලේකම්වරුන් විසින් ලියාපදිංචිය අළුත් කිරීමේ අයදුම්පත්‍රය පිටපත් 2 කින් සම්පූර්ණ කර සමෘද්ධි චක්‍රලේඛ 2018/06/ප්‍රජාමූල/07/2018/02 හි 3.2 හි සඳහන් ලියවිලි සමග මාසයක් ඇතුලත සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රජාමූල සංවිධාන හා ක්‍රීඩා අධ්‍යක්ෂ වෙත භාර දීම කල යුතුය. ( 3.2 ) හි (ආ) යටතේතොරතුරු සැපයීමේදී අළුතින් එකතු වූ ප්‍රජාමූල සංවිධාන නාමලේඛණය එවිය යුතුය)

(IV) ඉහත ලියවිලි සම්පූර්ණ කර භාර දුන් පසු ලියාපදිංචි සහතිකයේ අංකයෙන් එකී ප්‍රජාමූල සංවිධානයේ 2019 වර්ෂයට ලියාපදිංචිය අළුත් කල බවට ලිපියක් එකී සමෘද්ධි ප්‍රජාමූල සංවිධානය අයත් බල ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් සමෘද්ධි ප්‍රජාමූල සංවිධානයේ සභාපතිවරයා වෙත අයදුම්පත්‍රය භාරගෙන දින 45 ක් ඇතුලත නිකුත් කල යුතුය.(ඇමුණුම 06 )

(V) සියළුම සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන ඉහත ලියවිලි සම්පූර්ණ කර භාර දුන් පසු ලියාපදිංචි සහතිකයේ අංකයෙන් එකී ප්‍රාදේශීය සංවිධානය 2019 වර්ෂයට ලියාපදිංචිය අළුත් කල බවට ලිපියක් අධ්‍යක්ෂ ජනරාල්/ප්‍රජාමූල සංවිධාන හා ක්‍රීඩා අධ්‍යක්ෂ විසින් සමෘද්ධි ප්‍රාදේශීය සංවිධානයේ සභාපතිවරයා වෙත අයදුම්පත්‍රය භාරගෙන දින 45 ක් ඇතුලත නිකුත් කිරීම සඳහා අදාල ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් වෙත ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතුය.(ඇමුණුම 07 )

06. සියළුම සමෘද්ධි ප්‍රජාමූල සංවිධානවල සහ සමෘද්ධි ප්‍රාදේශීය සංවිධානවල ලියාපදිංචිය අළුත් කිරීමේ අයදුම්පත්‍ර වාර්ෂික මහ සභා රැස්වීම් පවත්වා මාසයක් ඇතුලත ඉදිරිපත් කල යුතු අතර ප්‍රමාද වී ඉදිරිපත් කරන අයදුම්පත්‍ර සඳහා සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතිය වෙත ගෙවන ලද රු.300/- ක ප්‍රමාද ගාස්තුවක් අදාල ප්‍රජාමූල සංවිධාන සහ ප්‍රාදේශීය සංවිධානවලින් ගෙවිය යුතු අතර එම මුදල ගෙවූ බවට තහවුරු ලිපියක් අමුණා එවීමට කටයුතු කල යුතුය. තවද ලියාපදිංචිය අළුත්කිරීම ප්‍රමාද කරනු ලබන ප්‍රජාමූල සංවිධාන සහ ප්‍රාදේශීය සංවිධාන සඳහා සමෘද්ධි සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් ලබා දෙන ප්‍රතිලාභ ද අහිමි විය හැකි බව වැඩිදුරටත් සඳහන් කරමි.

පී.ආර්.ඩී.එච්.අනුරවංශ
නියෝජ්‍ය අධ්‍යක්ෂ(ප්‍රජාමූල සංවිධාන හා ක්‍රීඩා)
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට